---

**බලපිටිය ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 12 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව බලපිටිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට බලපිටිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එකී මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු රු.3,768,211 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් සහ ණයහිමියන් රු.3,768,211 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මුද්දර ගාස්තු ආදායම රු.19,396,480 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.17,760,551 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියෝ රු.1,635,929 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව තිබුණු රු.6,059,412 ක් වූ දායක මුදල් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ගිණුම් විෂයයන් 06 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.41,988,402 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.51,479,924 ක් විය. මේ අනුව රු.9,491,522 ක වෙනසක් පැවතුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

#### (අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.3,079,962 ක් විය.

#### (ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.122,722,396 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,909,912 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,264,049 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 4,551 | 4,512 | 12,675 |
| (ii) | බදු කුලී | 4,557 | 1,366 | 664 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,702 | 5,355 | 225 |
| (iv) | වෙනත් ආදායම් | 55,340 | 47,104 | 20,867 |

### 2.2.2 1% බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි වූ හෝටල්, ආපන ශාලා සහ ලැගුම්හල් සඳහා පෙර වර්ෂයේ ආදායම් මත 1% ක ගාස්තුවක් අය කළයුතු වුවත්, සභා බලප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන හෝටල් 02 කින් 2012 වර්ෂය සඳහා 1% බලපත්‍ර ගාස්තු අය කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 550,825 |
| (ii) | මුද්දර ගාස්තු | 20,316,152 |

**2.2.4 කඩ කාමර බදුදීම**

බලපිටිය පොදු වෙළඳපොල කඩ කාමර බදුදීම් පිළිබඳව 2013 පෙබරවාරි 26 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) සිල්ලර වෙළඳාම සඳහා බදු දී තිබූ කඩ කාමර 04 ක් සාප්පු කඩ කාමර 04 ක් සහ එළවළු කඩ කාමර 16 ම බදුකරුවන් විසින් වසා තිබුණි.

(ii) බදුකරුවන් සමග ඇති කරගත් ගිවිසුමේ 12 වන කොන්දේසියට අනුව මාස දෙකකට වඩා බදුකුලී නොගෙවා සිටියහොත් කඩ කාමරයෙන් ඉවත් කිරීමට හා බදුකුලී අයකර ගැනීමට සභාවට බලය ඇත යන්න දක්වා තිබුණ ද, එසේ කටයුතු නොකිරීම නිසා රු.632,510 ක බදු කුලී හිඟව පැවතුණි.

(iii) පළාත් පාලන කොමසාරිස් විසින් 2012 දෙසැම්බර් 27 දින නිකුත් කරන ලද අංක: ද.ප.පා./ පා.පා.කො./2010/01 දරන චක්‍රලේඛයේ 5 වන ඡේදය අනුව සෑම ගිවිසුමක් ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතුය යන්නත්, 6 වන ඡේදය අනුව වසර 05 කට වරක් නව තක්සේරුවක් කළ යුතුය යන්නත් දක්වා තිබුණ ද, එළවළු කඩ කාමර 16 හිම ගිවිසුම් කාලය 1999 වර්ෂයේ දී අවසන් වී තිබූ අතර, සිල්ලර කඩ කාමර 04 හි හා සාප්පු කඩ කාමර 06 ක ද ගිවිසුම් කාලය 2010 වර්ෂයේ දී අවසන්ව තිබුණි. විගණන දිනය දක්වාම සභාව නව ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(iv) කඩ කාමර සඳහා ඇතුළුවන කොරිඩෝවේ පදික වෙළෙඳුන් වෙළඳාම් කරන බවත් කඩ කාමර අවට ඉතා අපිරිසිදුව පැවතුණු බවත් නිරීක්ෂණය විය.

**2.3 අධිභාර**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.193,306 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ස්ථිර / තාවකාලික / අනියම් / ආදේශක / කොන්ත්‍රාත් හෝ වෙනත් කිසියම් පදනමත් මත බඳවා ගැනීම් කරනු ලබන්නේ නම් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගතයුතු බව දක්වා තිබුණ ද, එලෙස අනුමැතිය ලබා නොගෙන සභාව සේවකයින් 23 දෙනෙකු බඳවා ගෙන 2012 වර්ෂය තුළ සභා අරමුදලින් රු.4,243,409 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

## 2.5 වීථි පහන් නඩත්තු දීමනා

සභාව විසින් 2012 වර්ෂය තුළ වීථි පහන් මිළදී ගැනීම සඳහා රු.2,151,948 ක් ද, වීථි පහන් නඩත්තුව සඳහා රු.670,689 ක් ද වැයකර තිබුණි.

(i) වීථි පහන් නඩත්තු දීමනා ලබා ගැනීම සම්බන්ධයෙන් 2012 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ii) බලප්‍රදේශයේ නඩත්තු කරන වීථි පහන් පිළිබඳ විස්තර දැක්වෙන ලේඛනයක් සකස් කර නොතිබුණි.

## 2.6 ඉඩම් වෙන්දේසි

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) වැලිතර ඉඩම්

(i) වැලිතර, අක්කර 2 යි පර්චස් 11.50 ක් වූ ඉඩම පිඹුරු අංක 1860 මගින් කැබලි 38 කට බෙදා වෙන්කර, 2012 අගෝස්තු 17 දින සංවර්ධන බලපත්‍රයක් ලබා දී තිබුණි. එසේ වුවද, මුල් බෙදුමට අදාළ අක්කර 03 රූඩ් 03 පර්චස් 03 ක් වූ ඉඩම සඳහා අනුමැතියක් නොතිබිය දී, පිඹුරු අංක 1860 ට අදාළ අනු බෙදුම සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

(ii) ඉඩමට අදාළ ඔප්පු සහ පිඹුරුපත් සකස් කර අනුමත කරවාගෙන නොතිබූ අතර, සභාවට ලබා දියයුතු 10% ක බිම් ප්‍රමාණය ද ලබා දී නොතිබුණි.

(iii) නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති විසින් 2008 දෙසැම්බර් 16 දිනැති නිකුත් කර තිබුණු අංක : 5/2/1/384 දරන චක්‍රලේඛයේ 7(iii) වගන්තිය අනුව ඉඩම් අනු බෙදුම් කිරීම සඳහා පළමු බිම් කොටසට රු.1,000 ක් ද, ඉතිරි කොටස් සඳහා රු.500 ක් බැගින් ද ඉඩම් කැබලි කර විකිණීමට පෙර සභාව විසින් අනුකූලතා සහතිකය නිකුත් කර අය කරගත යුතු වුවද, අනුකූලතා සහතික ලබා නොගෙන වෙන්දේසිකරු විසින් විගණන දිනය වූ 2013 මාර්තු 01 දින වන විට ඉඩම් කැබලි සියල්ල විකුණා තිබුණි. අනුකූලතා සහතිකයක් ලබාගෙන නොතිබීම නිසා සභාවට රු.19,000 ක පාඩුවක් සිදු වී තිබුණි.

**(ආ) කොස්ගොඩ මහපැලැන වත්ත ඉඩම**

(i) කොස්ගොඩ මහපැලැන වත්තේ අක්කර 3 යි පර්චස් 38 ක් පිඹුරු අංක 3665 මගින් කැබලි කර තිබුණු අතර, කැබලි සැලැස්ම 2011 ජුනි 01 දින අනුමත කර තිබුණි. මින් කොටසක් වූ අක්කර 2 යි පර්චස් 38 ක් පිඹුරු අංක 3684 මගින් කැබලි 35 කට බෙදා වෙන්දේසි කිරීම සඳහා 2011 නොවැම්බර් 03 දින සභා අනුමැතිය ලබා දී තිබුණි.

(ii) 2013 මාර්තු 01 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී සභාවට ලබා දී තිබූ ඉඩම් කොටසේ ඊට යාබද ඉඩම්කරු ළිඳක් සහ තාවකාලික නිවසේ කොටසක් ද ඉදිකර තිබූ බව නිරීක්ෂණය විය.

(iii) අනුකූලතා සහතිකය සඳහා අයකර නොගැනීම නිසා සභාවට රු.18,000 ක පාඩුවක් සිදු වී තිබුණි. මෙසේ අනුකූලතා සහතිකයක් ලබා නොගෙන ඉඩම් කැබලි විකුණා තිබීම නිසා දිනකට රු.50 බැගින් දඩ ලෙස සභාවට රු.6,000 ක (දින 120 x 50) ආදායමක් ද අයකර ගතයුතුව තිබුණි.

**2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**2.8 අභ්‍යන්තර විගණනය**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද සිදුකර නොතිබූ අතර 2006 අගෝස්තු 28 දිනැති හා අංක : PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය